**දකුණු පළාත් සභාව**

**දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය**

**(ද.ප.ධීවර,සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු , ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)**

**තනතුරු පුරප්පාඩු**

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ පුරප්පාඩු වී ඇති පහත සදහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් දකුණු පළාතේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැදවනු ලැබේ.

## 01. සංවර්ධන නිලධාරි (01)

**1.** අධ්‍යාපන සුදුසුකම්

**1.1** බාහිර අයදුම්කරුවන්

(අ) .විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. (ගිණුම්කරණය ක්ෂේත්‍රයට සම්බන්ධ උපාධියක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.)

**1.2** වැටුප් කේතය හා පරිමාණය - (MA 3) 53,940-800x10-1,190x11-1,320x10-1,350x5-94,980 මීට අමතරව රජයේ අනුමත දීමනා හිමි වේ.

**1.3** වයස **:** අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 02. පර්යේෂණ සහකාර (01)

**2.** අධ්‍යාපන සුදුසුකම්

**2.1** බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන, කෘෂිකර්මය,ජලජීවී,පශු සම්පත්,ආහාර තාක්ෂණය,අලෙවි කළමනාකරණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා NVQ 5 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**2.2** අභ්‍යන්තර අයදුම්කරුවන්

**ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අදාල සුදුසුකම් සපුරා තිබීම.**

**2.3** වැටුප් කේතය හා පරිමාණය - (MA 2-1) 50,540-540x10-630x7-890x4-1,190x20-87,710 මීට අමතරව රජයේ අනුමත දීමනා හිමි වේ.

**2.4** වයස : අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 03. ස්ථානභාර නිලධාරි (01)

**3.** අධ්‍යාපන සුදුසුකම්

**3.1** බාහිර අයදුම්කරුවන්

(අ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල
ii. ගණිතය
iii. ඉංග්‍රිසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ). තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :-

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝටල් කළමනාකරණය, උද්‍යාන අලංකාරණය, ජලනාල කාර්මික හෝ විදුලි කාර්මික පාඨමාලාවක් හදාරා තිබීම.

**3.2** අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ). ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ" "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ඇ). සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ). නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

3.4 වැටුප් කේතය හා පරිමාණය - (MA 1-1) 46,220-540x10-630x7-890x4-1,190x20-83,390 මීට අමතරව රජයේ අනුමත දීමනා හිමි වේ.

**3.4** වයස **:** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**පොදු කොන්දේසි**

**4**. වෙනත් **:** සැම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය., ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ට නොඅඩු කාලයක් දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය . තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.,විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**5.** පත්වීමේ ස්වභාවය -ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සදහා හිමිකම් සහිත වේ. ක.සේ.ච. 01/2025 හි උපලේඛන I හා II අනුව වැටුප් පරිමාණයන්ට අදාළ වැටුප් ගෙවනු ලැබේ.

**6.** තෝරා ගැනීමේ ක්‍රමවේදය - විවෘත තරග විභාගයක් හා /හෝ පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බදවා ගනු ලැබේ.

සම්පූර්ණ විස්තර සහිතව ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සහිත අයදුම්පත් (සහතික කරන ලද සහතික වල ඡායා පිටපත්ද සහිතව) **2025/09/02** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"සභාපති, ද.ප.කාර්මික සංවර්ධන අධිකාරිය, අංක 349 ½ , මාතර පාර, කටුගොඩ, ගාල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සදහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ හා නියමිත පරිදි නියමිත දිනට ඉදිරිපත් නොකරන හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
ද.ප.කාර්මික සංවර්ධන අධිකාරිය,
අංක 349 ½ ,
මාතර පාර,කටුගොඩ,ගාල්ල
091-2226296

**Source: spida.sp.gov.lk/ (2025.08.20)**